මානුෂ හා අධිමානුෂ චරිත නිරූපණය කරමු

මානුෂ චරිත පිළිබඳ ඔබ මින් පෙර පාඩම් වල ඉගෙනගෙන ඇත.

අධි මානුෂීය චරිත යනු මිනිස් ස්වාභාවය ඉක්මවා ගිය චරිත ලෙස හඳුන්වා දිය හැකිය. එනම්,

- දෙවියන්
- දිය කිඳුරන්
- රාක්ෂයන්
- භූතයන්
- මායාකාරියන්
- යෝධයන්
- සුරංගනාවියන්

යන චරිත දැක්විය හැකිය.මෙවැනි චරිත අපට සැබෑ ජීවිතයේ දැකිය නොහැක. එම නිසා මෙවා නිරූපණයේදී නිර්මාණාත්මක චින්තනය හා පරිකල්පනය තිබිය යුතුය.

වර්තමානයේ අප රූපවාහිනියෙන් දකින කාටූන් චරිත තුළ ද අධි මානුෂීය චරිත දැකිය හැකි වේ.

- හිම කුමාරි
- බටකොළ ආච්චී
- ඇලඩ්නගේ පුදුම පහන
- ලස්සන වසීලිස්සා

අතීතයේ ශාන්තිකර්ම සඳහා යොදාගත් වෙස්මුහුණු තුළ ද අධිමානුෂීය චරිත දැකිය හැකිය. මෙවැනි චරිත අධ්‍යනය කිරීමෙන් ඔබට අධිමානුෂීය චරිතයක් නිරූපණය කිරීමට යම් අදහසක් ලබාගත හැකිය. ඒ සඳහා ඔබට පරිකල්පන ශක්තිය හා නිර්මාණශීලී හැකියාවක් තිබිය යුතුය. මානුෂ හා අධිමානුෂ චරිත උපයෝගී කරගෙන ඔබට ක්ෂණික නිරූපණ කළ හැක.

පැවරුම්:

- අධිමානුෂික චරිත කිහිපයක් ඇද දක්වන්න.
- අධිමානුෂික චරිත දැකිය හැකි වේදිකා නාට්‍ය කිහිපයක් නම්කරන්න.